

# 9 තිලමුට්ඨී ජාතකය

බෝධිසත්ත්වයන්ගේ පෙර ආත්මවල කතා ලෙස නිර්මාණය කරන ලද ජාතක කතා ඇතුළත් පන්සිය පනස් ජාතක පොත පැරණි සිංහල පත පොත අතර වැදගත් පොතක් සේ සැලකෙයි. මිනිස් චරිත පමණක් නො ව සත්ත්ව චරිත ද යොදා ගනිමින්, ජීවිතය සාර්ථක කර ගැනීමට උපදේශ සපයන ග්‍රන්ථයක් ලෙස ද ජාතක පොත සැලකිය හැකි ය. කුරුණෑගල රාජධානි සමයේ වීරසිංහ ප්‍රතිරාජ නම් අමාත්‍යවරයාගේ ඉල්ලීමක් පරිදි රචනා කරන ලදැයි සැලකෙන පන්සිය පනස් ජාතක පොතේ ඇත්තේ කතා 547කි. ආසන්න දහයේ ගුණාකාරයට වැටයීමෙන් කතා 550ක් සේ ගත් බව සිතිය හැකි ය. ජාතක කතා පොතෙන් උපුටා ගත් 'තිලමුට්ඨී ජාතකය' මේ පාඩමට ඇතුළත් වේ.

යට ගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ බ්‍රහ්මදත්ත නම් රාජ කුමාර කෙනෙක් ඇත්තාහ. ඒ බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝත් තමන්ගේ පුතණුවන්ට මස්සෙන් දහසක් හා පිළී සඟළක් හා පත් කුඩයක් හා වහන් සඟළක් හා බත් මුළක් ආදි වූ දෙය දී "දිසාපාමොක් ආචාරීන් කරා ගොස් ශිල්ප ශාස්ත්‍ර ඉගෙන ගෙන එව" යි යැවූහ.

එකියන කුමාරයාත් තක්සලා නුවරට ගොස් දිසාපාමොක් ආචාරී දකින්නට ගිය වේලාවට දිසාපාමොක් ආචාරීහු ශිෂ්‍යයන් ශිල්ප ශාස්ත්‍ර උගන්නා මිදුලෙහි සක්මන් කොට සිටියාහ. ඒ වෙලාවට රාජ කුමාරයන් ළඟ එන්නා දැක "ඇයි තොප කුමට අවුදැ" යි විචාරා "ශිල්ප උගන්නට ආමි" යි කී කල්හි ආචාරීන්ට වස්තු දී ශිල්ප දැක උගනු ද? කුලියට උගනු ද? යි විචාළ කල්හි රාජ කුමාරයෝත් ආචාරී භාගයක් පළමු කොට තබා වැඳ හොත්තාහ. එවිට දිසාපාමොක් ආචාරීහු "රාජ කුමාරවරුන් නම් කල් යවා ශිල්ප උගන්නට බැරි ය, වහා ශිල්ප උගත මැනැවැ" යි කියා සාමාන්‍ය නකත් සලස්වා ශිල්ප උගන්නට පටන් ගැන්වූහ. එක් දවසක් රාජ කුමාරයන් පිටි පස්සේ ලා ගෙන නාන්නට වැවට යමින් සිටියාහ. ඒ වේලාවට එක්තරා මැලි ස්ත්‍රියක් එළ කරපු තල අව්වේ වනා වියළමින් සිටියාය. ඒ වේලාවට දිසාපාමොක් ආචාරී පස්සේ යමින් සිටි රාජ කුමාරයෝත් එකියන එළ තල දැක කන්න අභිප්‍රාය ඇතිව ගාණක් අතට කා පූහ. එකියන මැලි ස්ත්‍රීත් ඒ දැක "කුඩා කොල්ලා හෙයින් බඩ සයින් කා පුව මැනැවැ" යි සිතා බැණ නො නැඟී සිටියාහ.

දෙවන දවසුත් එපරිද්දෙන් ම රාජ කුමාරයෝත් එළ තල ගාණක් ඇර ගෙන ගියාහ. තුන් වන දවසුත් එපරිද්දෙන් ම ඇර ගත්තාහ.

එවිට ස්ත්‍රී සිතන්නී "මේ නියායෙන් දවස් පතා කත් නම් මාගේ තල නිමා යෙයි" කියා සිතන්නී "දිසාපාමොක් ආචාරීන් වහන්ස, තමන් වහන්සේගේ අතවැස්සන් ලවා මගේ තල ගන්නා සේකැ" යි මොර ගෑව. එවිට දිසාපාමොක් ආචාරී "ඇයි මැණියනි, මම කුමන අන්‍යාවක් කෙළෙම් ද" යි කී ය. එවිට ස්ත්‍රී කියන්නී, "නුඹ වහන්සේ පස්සේ යන අතවැසි තුන් වාරයක් මාගේ තල ඇර ගෙන ඉනිබ්බේත් තල ගනිත් නම් මාගේ තල නිමන්නේ ය" යි කියා මොර ගා කී ය. එවිට දිසාපාමොක් ආචාරී කියන්නාහු "ඊට තොප වික්ෂේප නො ව; තොපගෙන් කෑ තලවලට මම මිල දෙමි" යි කීහ.
එවිට ස්ත්‍රී කියන්නී "කෑ තලයට මිල එපයි; ඉනිබ්බේ මාගේ තල නොකන ලෙස අවවාද කියව" යි කීහ. එවිට දිසාපාමොක් ආචාරී කියන්නාහු "ඉදිරියේ

දී පාටව කෙරෙමි'' යි කියා අතවැස්සන් දෙන්නකුන් ලවා දැත් තර කර අල්ලා උණ පත්තෙන් පාර ගණනක් ගස්වා පාටව කරවූහ.

එවිට රජ කුමරාත් දැස් රත් කොට උරණව මුහුණ බලා වෛර බැන්දේය. දිසාපාමොක් ආචාරීහු තමන් කෙරේ වෛර බැඳි නියාව දත්හ; දැන දැනත් සියලු ශාස්ත්‍ර උගන්වා නිපුණ කරවූහ. ඒ රාජ කුමාරයෝත් දිසාපාමොක් ආචාරීන් වැඳ නුවරට යන්නාහු ''ආචාරීන් වහන්ස, මම සැප සේ රාජ්‍යයට පැමිණියෙම් වීම් නම් නුඹ වහන්සේ කැඳවා එවමි; එවිට අව මැනැවැ'' යි කියා තමන්ගේ රටට ගොස් තමන්ගේ පිය රජ්ජුරුවන්ට ශිල්ප දැක්වූහ.

එවිට රජ්ජුරුවෝ සමාධිව ''මා ඇස් හමුයේ මොහුගේ රාජ්‍යශ්‍රීය දකිමි'' යි සිතා රාජ්‍යශ්‍රීය දුන්නාහ. එකියන රාජ කුමාරයෝත් රාජ්‍යයට පැමිණ දිසාපාමොක් ආචාරීන්ට පාටව කරන්නා කැමැතිව ආචාරීන් වහන්සේ මා කෙරේ සැක නො සිතා වහා එන්නේ යහපතැ යි කියා යැවූහ. එපවත් දිසාපාමොක් ආචාරීන් වහන්සේ අසා ''රජ්ජුරුවන් වහන්සේ මා කැඳවා එවන්නේ මට ස්නේහයෙන් නො වෙයි; මා ගැසු පාරට නිග්‍රහ කරන්නට ය'' යි සිතා දැන කුමාරයෝ බාලයෝ ය; එසේ හෙයින් මා කියන අවවාද දැන් අසන්නෝ නො වෙති. පසුව වැඩිමාලු වයසට පැමිණි කල යෙමි යි සිතා නො ගොස් කල් යාමක් කොට රජ්ජුරුවන් වැඩිමාලුව ගිය පසු දිසාපාමොක් ආචාරීහු නො කැඳවා ම තුමූ ගියහ. ගොස් වාසල සිට තමන් ආ පවත් කියා යැවූහ. එපවත් අසා රජ්ජුරුවෝ ''යහපත ආචාරීන් වහන්සේ කැඳව'' යි කියා කැඳවා කියන්නාහු ''ඇයි ආචාරීනි, තොපි මරණ නළලේ තබා අවු ද? එදවස් තොප විසින් මා තල කැව යි කියා දෙන්නකුන් ලවා අත් දෙක අල්ලා උණ පත්තෙන් තැල්වූ පාර තව දක්වා මගේ පිටේ රිදෙන්නේ ය'' යි කියා ''අමාත්‍යයෙනි, මේ දිසාපාමොක් මරව'' යි කීහ. එවිට දිසාපාමොක් ආචාරී කියන්නාහු රජ්ජුරුවෙනි, එදවස් තොප කෑ තලයට පාරක් නො ගැසී නම් දෙවෙනි දවස් අනික් සොරකමක් කරනා සේක. එවිට යම් කෙනෙක් මරා දමා පූ නම් මේ රාජ්‍යශ්‍රීය ලබන්නට නැත්තේ වේ ද? එසේ හෙයින් හික්මවීම පිණිස කළ පාටවයට උත්තමයෝ වෛර නො බඳිති'' යි කියා කීහ.

එපවත් අසා බොහෝ අමාත්‍යයෝත් ''එසේ ම ය දේවයන් වහන්ස, දිසාපාමොක් ආචාරීන් වහන්සේ පිණිස රාජශ්‍රීය නුඹ වහන්සේ ලද සේකැ''යි කීහ. රජ්ජුරුවෝ ඒ කාරණය සිතා ගෙන ආචාරීන්ගේ බොහෝ ගුණ සඳහන් කොට කියන්නාහු ''දිසාපාමොක් ආචාරීනි, රාජ්‍යයට පැමිණියේ තොප පිණිස ය; එසේ හෙයින් රාජ්‍යය පිළිගනුව'' යි කීහ. එපවත් අසා දිසාපාමොක් ආචාරීහු

රාජ්‍යය නො ගිවිස්සාහ. රජ්ජුරුවෝත් තමන්ගේ මිනිසුන් යවා ආචාරීන්ගේ අඹුදරුවන් ගෙන්වා ගෙන තමන්ගේ නුවර ලා ආචාරීනට බොහෝ තරම් පදම් සලස්වා තමනට පුරෝහිත තනතුරෙහි තිබුවේ දැයි වදාරා මේ තිලමුට්ඨී ජාතකය නිමවා වදාළ සේක.

## අරුත් පැහැදිලි කිරීම

| | |
|---|---|
| මස්සෙන් දහසක් | මසුරන් දාහක්/රන්කාසි දාහක් |
| පිළී සඟළක් | රෙදි යුගලයක්/ඇඳුම් දෙකක් |
| පත් කුඩයක් | හිසට අල්ලා ගෙන යන තල්පතක් |
| වහන් සඟළක් | පාවහන් යුගලයක් |
| ආචාරී භාග | ගුරු පඬුරු |
| සාමාන්‍ය නකත් සලස්වා | ශුභ වේලාවක් බලා |
| පිටිපස්සේ ලා ගෙන | පසු පසින් කැඳවා ගෙන |
| මැලි ස්ත්‍රියක් | මහලු ස්ත්‍රිය |
| එළ තල | කළු පැහැති පියලි ඉවත් කළ තල |
| ගාණක් අතට | අතට අල්ලන ප්‍රමාණය/මිටක් |
| බඩ සයින් | බඩගිනි බැවින් |
| කා පුව මැනවයි | කෑවාට කමක් නැතැයි |
| බැණ නො නැඟී | කතා නො කොට |
| මේ නියායෙන් | මෙපරිද්දෙන්/මේ ක්‍රමයෙන් |
| අතවැස්සන් | අන්තේවාසිකයන්/යටත් වැසියන්/ශිෂ්‍යයන් |
| අන්‍යායවක් | අවනීතියක්/නුසුදුසු ක්‍රියාවක් |
| ඉනිබ්බෙත් | ඉන් පසුවත් |
| වික්ෂේප නො ව | ශෝක නො කරව/පසුතැවිලි නො ව |
| පාටව කෙරෙමි | දඬුවම් කරමි |
| උණ පත්තෙන් | උණ පතුරකින් |
| උරණව | කෝප වී |
| නිපුණ කරවූහ | පුහුණු කළහ |
| අභිප්‍රාය ඇතිව | කැමැත්ත ඇතිව/අදහස ඇතිව |

| | |
|---|---|
| සමාධිව | සතුටට පත්ව |
| ස්නේහයෙන් | ආදරයෙන්/සෙනෙහසින්/කරුණාවෙන් |
| වැඩිමාලු | වයස්ගත වූ/වයසින් මුහුකුරා ගිය |
| නිග්‍රහ | අවමාන |
| බොහෝ තරම් පදම් සලස්වා | බොහෝ සම්පත් දී සුදුසු තත්ත්වයේ පිහිටුවා/පුරෝහිත තනතුරෙහි පිහිටුවා |

## අවබෝධය

1. මේ කතාවේ ප්‍රධාන චරිත මොනවා ද?
2. රාජ කුමාරයා තල කැවේ කුමන කාර්යයක් සඳහා යමින් සිටිය දී ද?
3. මහලු ස්ත්‍රිය, කුමරා කෑ තල වෙනුවෙන් බලාපොරොත්තු වූයේ මොනවා ද?
4. රාජ කුමාරයාගේ පණිවුඩය ලැබුණ ද දිසාපාමොක් ආචාරීන් ඔහු හමුවට නො ගොස් සිටියේ මන්ද?
5. තමා මැරීමට රජ කුමරු නියෝග දුන් අවස්ථාවේ දිසාපාමොක් ඇදුරුතුමා, නිදහසට කරුණු වශයෙන් පැවසුවේ කුමක් ද?

## ලිඛිත අභ්‍යාස

1. **පහත සඳහන් ශීර්ෂ යටතේ තිලමුට්ඨි ජාතක කතාව සරලව ලියා දක්වන්න.**

    i. කුමරු දිසාපාමොක් ආචාරීන් වෙත යෑම
    ii. තල කෑමේ සිද්ධිය
    iii. ආචාරීන්ට පණිවුඩ යැවීම
    iv. ආචාරීන් රජු හමුවට යෑම

2. **වරහන් තුළින් නිවැරදි පිළිතුර තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.**

    i. දිසාපාමොක් (ආචාරීහු/ආචාරීන්) බ්‍රහ්මදත්ත කුමරුට ශිල්ප ඉගැන්වූහ.
    ii. (රාජ කුමාරයන්/රාජ කුමාරයා) නාන්නට වැවට ගියේ ය.
    iii. (කාන්තාවක්/කාන්තාවක) තල වේළමින් සිටියා ය.
    iv. (අතවැස්සන්/අතවැස්සෝ) කුමරුගේ දෑත් අල්ලා ගත්හ.
    v. (අමාත්‍යයන්/ආමාත්‍යයෝ) දිසාපාමොක් ආචාරීන්ගේ ගුණ කීහ.

## ප්‍රායෝගික අභ්‍යාස

1. **තිලමුට්ඨි ජාතකයෙන් ජීවිතයට ලැබිය හැකි ආදර්ශ පිළිබඳව පන්තිය ඉදිරියේ කතාවක් කරන්න.**

2. **වෙනත් ජාතක කතාවක් සොයා ගෙන කියවන්න. ඒ කතාවේ සහ තිලමුට්ඨි ජාතකයේ දැකිය හැකි සමානතා විමසා බලන්න.**